# කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
# තේ පර්යේෂණ මණ්ඩලය

# புரப்பாடு

තලවාකැලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ පවත්නා පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. නේවාසික ඉංජිනේරු
2. පර්යේෂණ නිලධාරී
3. තාක්ෂණික නිලධාරී(පර්යේෂණ හා සංවර්ධන)
4. තාක්ෂණ නිලධාරී (සිවිල්)

## 01). නේවාසික ඉංජිනේරු (Resident Engineer)

**රැකියා විස්තරය**

සියලුම සිවිල්, විදුලි හා යාන්ත්‍රික කටයුතු පිළිබඳ සමස්ත සැලසුම් කිරීම, ඇස්තමේන්තු කිරීම, ඉදිකිරීම්, නඩත්තු කිරීමේ කටයුතු අධීක්ෂණය හා සැලසුම් කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි.

**බාහිර**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ඉංජිනේරු විද්‍යාව (සිවිල්) පිළිබඳ ප්‍රථම උපාධියක් සහ සුදුසුකම් ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක (03) පළපුරුද්ද

හෝ

තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (සිවිල්) NDT සහතිකය හෝ ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (NDES) සමග සුදුසුකම් ලැබීමෙන් පසු රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර අටක (08) පළපුරුද්ද

**අභ්‍යන්තර**

කනිෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ (JM 1-2) ඉංජිනේරු සහකාර (සිවිල්) වශයෙන්, I ශ්‍රේණියේ (Grade I) අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවාවක්

**වැටුප් පරිමාණය :** MM 1- 2 (2016) රු. 54, 550/- - 10x 1, 375- 15x 1, 910 - රු. 96, 950/- (මාසිකව)

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 02). පර්යේෂණ නිලධාරී (Research Officer)

**රැකියා විස්තරය**

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (SRO), ප්‍රධාන පර්යේෂණ නිලධාරී (PRO) හෝ අංශ ප්‍රධානියා (HOD) ගේ අධීක්ෂණය යටතේ පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම සහ දත්ත ඉදිරිපත් කිරීම සහ දත්ත රැස් කිරීම සහ වාර්තා කිරීම, තාක්ෂණික, අත්හදාබැලීමේ සහ ව්‍යාප්ති නිලධාරීන්ට මග පෙන්වීම හා පර්යේෂණ ව්‍යාපෘති හඳුනා ගැනීම සහ සැලසුම් කිරීමේදී SRO, PRO හට සහාය වීම.

**බාහිර**

සුදුසු විෂය සංයෝජනයක් සමග පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යා/කෘෂිකර්මය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ ඉහළ (First or Second class upper) සාමාර්ථයක් සමග වසර හතරක (04) විශේෂ උපාධියක්.

හෝ

සුදුසු විෂය සංයෝජනයක් සමග පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යා/කෘෂිකර්ම හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ දෙවන පන්තියේ පහළ (Second Class Lower) සාමාර්ථයක් සහිත වසර හතරක (04) විශේෂ උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පශ්චාත් උපාධියක්.

හෝ

සුදුසු විෂය සංයෝජන සහිත විද්‍යා/කෘෂිකර්ම හෝ ඉංජිනේරු උපාධියක් සහ අදාළ විෂයයෙහි වසර දෙකක (02) පශ්චාත් උපාධි පර්යේෂණ උපාධියක්.

**අභ්‍යන්තර**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යාව / කෘෂිකර්මය හෝ ඉංජිනේරු උපාධියක් සමග අත්හදාබැලීමේ නිලධාරියෙකු ලෙස වසර හයක (06) සතුටුදායක සේවා කාලයක්.

**වැටුප් පරිමාණය :** AR 1 (2016) (I) රු. 53,150 – 10 x 1,375 – 15 x 1,910 – රු. 95,550/- (මසකට)

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ලිඛිත තරග විභාගයකින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්.

## 03). තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) Technical Officer (R&D)

**රැකියා විස්තරය**

ආයතනයේ තාක්ෂණික කටයුතු සඳහා පහසුකම් සැලසීම, සහාය දීම සහ කළමනාකරණය කිරීමට සහය වීම හා ඊට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු වලට අදාළ තාක්ෂණික කටයුතු සිදුකිරීමේ වගකීම දරයි.

**බාහිර**

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 05 ට නොඅඩු විද්‍යා / කෘෂිකර්ම / වැවිලි කළමනාකරණය පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර**

ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** MA 2-2 (2016) රු. 30, 310 – 10x300 – 7x350 – 4x600 – 20x710 – රු. 52,360/- (මසකට)

**වයස :** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ලිඛිත තරග විභාගයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 04). තාක්ෂණික නිලධාරී (සිවිල්) Technological Officer (Civil)

**රැකියා විස්තරය**

ආයතනයේ සිවිල් කටයුතු සඳහා පහසුකම් සැලසීම, සහය වීම හා ඊට අදාළ කටයුතු කළමනාකරණයට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම.

**බාහිර**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 05 මට්ටමට නොඅඩු සිවිල් විෂය (Civil) පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර**

ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** MA 2-2 (2016) රු. 30, 310 – 10x300 – 7x350 – 4x600 – 20x710 – රු. 52,360/- (මසකට)

**වයස :** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය : ලිඛිත තරග විභාගයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වෙනත් ප්‍රතිලාභ :**

i. නිල නිවාස හිස්ව පවතී නම් නිල නිවාස සපයනු ලැබේ හෝ එසේ නොමැති නම් නවාතැන් වෙනුවට දීමනාවක් ගෙවනු ලැබේ.
ii. ආයතනයේ වෛද්‍ය යෝජනා ක්‍රමයේ පවතින නීතිරීතිවලට අනුව වෛද්‍ය ප්‍රතිලාභ හිමි වේ.
iii. අර්ථසාධක අරමුදල: තෝරාගත් අපේක්ෂකයා වැටුපෙන් 10%ක් සේවක අර්ථසාධක අරමුදලට දායක කළ යුතු අතර ආයතනය විසින් 15%ක් දායක වේ. ආයතනය සේවක භාරකාර අරමුදලට 3% ක දායකත්වයක් ද ලබා දෙනු ඇත.
iv. තේ පර්යේෂණායතනයේ තනතුරට අදාළ වන අනෙකුත් ප්‍රතිලාභ.

මෙම තනතුරු ස්ථිර තනතුරු වේ. තේ පර්යේෂණායතනයේ වෙබ් අඩවිය වන **www.tri.lk** වෙත පිවිසීමෙන් ගූගල් ආකෘතියෙන් (google form) ඉල්ලා සිටින තොරතුරු අනිවාර්යෙන් ඉදිරිපත් කළ යුතු අතර, පසු විපරම් කටයුතු සඳහා ජීව දත්ත පත්‍රිකාව සමග උප්පැන්න සහතිකයේ පිටපත, අදාළ අධ්‍යාපනික සහ වෙනත් වෘත්තීය සුදුසුකම්, සේවා සහතික පිටපත් සහ අයදුම්කරු පිළිබඳව සොයා බැලිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග 2024 අගෝස්තු 12 වැනි දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, ශාන්ත කුම්බ්ස්, තලවාකැලේ වෙත ලියාපදිංචි තැපැලෙන් යොමු කරන්න. තවද අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුවේ.

රාජ්‍ය සේවයේ/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලයේ නිලධාරීන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා හරහා යොමු කළ යුතු වේ. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතු විය හැකි බවත් කාරුණිකව සලකන්න.

අවශ්‍ය වැඩි විස්තර සඳහා තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය වන **www.tri.lk** වෙත පිවිසෙන්න.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය**
**ශාන්ත කුම්බ්ස්, තලවාකැලේ.**